හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II) -2020

---

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ (අදියර II) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 27 දින එළඹි අංක 3483 - එස්ආර්අයි සහ 3484- එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ප්‍රංශ නියෝජිත ආයතනය අතර 2018 ඔක්තෝබර් 17 දින එළඹි අංක සීඑල්කේ 1022 01 කේ දරන ණය පහසුකම් ගිවිසුමේ 03 ව්‍යවස්ථාවවේ 3.4.4 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය

---

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, එවකට විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ විදුලිබල අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර විදුලිබල මණ්ඩලය වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ස්ථාවර පද්ධති ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම සඳහා වැඩිවන බලශක්ති ඉල්ලුම අවශෝෂණය කර ගැනීම සහ ප්‍රතික්‍රියාශීලි බලශක්ති කළමනාකරණයට කොටුමා උපපොළවල් සහ ආශ්‍රිත රැහැන් ඉදිකිරීම් මගින් රටේ සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 39,453කට සමාන එජඩො මිලියන 264.7ක් වන අතර ඉන් රු. මිලියන 27,793කට සමාන එජඩො මිලියන 184.7ක් මූල්‍යායනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහ ප්‍රංශ නියෝජිත ආයතනය එකඟවී තිබුණි. වැඩසටහන එහි කටයුතු 2017 ජුලි 10 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර,වැඩසටහනේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | මුදල | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| | රු. මිලියන | | |
| (අ) සමාලෝචිත වර්ෂය තුළදී ණය මුදලින් මිලදී ගන්නා ලද මෝටර් වාහන 09ක් වෙනම දැක්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි. | 40.03 | ව්‍යාපෘතිය තවම ප්‍රාග්ධනිත නොකරන නිසා වාහන ප්‍රාග්ධනිත නොකෙරේ. | වැඩසටහනේ වාහන මූල්‍ය ප්‍රකාශනවල වෙනමම අනාවරණය කළ යුතුය. |
| (ආ) මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු. මිලියන 1,803ක ඉල්ලීම් ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා අනුව අනුරූපි වටිනාකම රු.මිලියන 1,595 ක් විය. මෙම හඳුනා නොගත් වෙනස සඳහා පැහැදිලි කිරීම් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 208.5 | පැකේජ 04 කේ සඳහා ගිවිසුම් අංක සීඑල්කේ 1022 අදාළ සෘජු ගෙවීම් විදේශ සම්පත් දෙපාර්තමේන්තු ප්‍රකාශනවල වාර්තා කර ඇති අතර ආසන්න වශයෙන් රු. මිලියන 5 වෙනසක් සඳහා සැසඳීම් පවත්වා ගෙන යනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොරතුරු අනුරූපී වාර්තා සමග එකඟ විය යුතුය. |
| (ඇ) ශුද්ධ විනිමය ලාභය මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ වෙනම දැක්වීම වෙනුවට පොළී සහිත ණය යටතේ දක්වා තිබුණි. | 292.16 | සටහන් කර ගන්නා ලදි. | විදේශ විනිමය ලාභය වෙනම දැක්විය යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2016 ජුනි 10 දිනැති අංක 2/2016 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | චක්‍රලේඛය මගින් ලබාදී ඇති උපදෙස් පරිදි අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයේ සෑම ව්‍යාපෘතියක් සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත්කරනු නොලැබේ. | වැඩසටහනේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කළ යුතුය. |
| (ආ) 2019 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 09 වගන්තිය | ව්‍යාපෘති සමාලෝචන කමිටු ස්ථාපිත කර නොතිබුණි.<br>තවද,වැඩසටහන මගින් ක්‍රියාත්මක කරන ලද | සියළුම ව්‍යාපෘති සංරචක සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් මාසික ප්‍රගති සමාලෝචනය සිදුකරනු ලැබේ. තවද, | ව්‍යාපෘති සමාලෝචන කමිටු ස්ථාපනය කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතුවල භෞතික ප්‍රගතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් නිරන්තරයෙන් සමාලෝචනය කර නොතිබුණි. | බලශක්ති අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති අධීක්ෂණය දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචනයන් සිදුකරනු ලැබේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 වැඩසටහනේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

**2016 ජූලි 31 දින සැලසුම් කළ දින සිට වර්ෂ 02කට වඩා ප්‍රමාදයන් සහිතව වැඩසටහනේ කටයුතු ආරම්භ කර තිබුණි. එමනිසා, මිල වෙනස්වීම්, බැඳීම් ගාස්තු වැනි කොන්ත්‍රාත් මත අමතර පිරිවැය සහ ව්‍යාපෘති කාලපරිච්ඡේදය දීර්ඝ කිරීම වැනි අවධානමක් පවතී.**

| | සංරචකය | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| | විදුලිබල කාර්යක්ෂමතාව සඳහා ඉල්ලුම් කළමනාකරණය | | |
| (අ) | වැඩසටහන් පරිපාලන අත්පොතට අනුව, ස්මාර්ට් ජාල සහ මැනුම් උපදේශන සේවය රු. මිලියන 1,617.82කට සමාන එ.ජ.ඩො මිලියන 11.1ක පිරිවැයකට ක්‍රියාත්මක කළ යුතුය. කෙසේවෙතත්, එය 2021 ජූලි 26 දින තෙක් ආරම්භ කර නොතිබුණි. | උපදේශකවරයෙකුගේ සේවාව යොදා ගැනීමකින් තොරව වෙනස් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගයක් සමග මෙයට සමාන වැඩ විෂය පථයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. | වැඩසටහනේ අරමුණු අත්පත් කර ගැනීමේ අරමුණින් වැඩසටහනේ කටයුතු නිසි පරිදි සැලසුම් කර ගැනීම සහ හඳුනා ගැනීම කළ යුතුය. |
| (ආ) | මධ්‍ය වෝල්ටීය ජාලයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම | | |
| (i) | ප්‍රගති වාර්තා අනුව, විවිධ හේතූන් නිසා බෙලිගහ සහ ඇතුල්කෝට්ටේ ප්‍රාථමික උපපොළවල් වැඩිදියුණු කිරීමේ සහ රත්නපිටිය ප්‍රාථමික උපපොළ ඉදිකිරීමේ සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වර්ෂ 3½ වඩා වැඩි කාලයක් ගෙන තිබුණි. කොන්ත්‍රාත්තුව එ.ජ.ඩො මිලියන 7.973කට 2020 ජූලි 08 දින පරිනමා තිබුණු අතර 2020 සැප්තැම්බර් 21 දින කටයුතු ආරම්භ කර තිබුණි. මෙම අරමුණ සඳහා රත්නනපිටියේ තෝරාගත් ඉඩම අදාළ අරමුණ සඳහා 2021 ජූලි 26 දින තෙක් අත්පත් කර ගෙන නොතිබුණු බව අනාවරණය විය. | නීතිපති දෙපාර්තමේන්තුව විසින් අනුමැතිය ලබාදීමේ ප්‍රමාදය හේතුවෙන් ණය ගිවිසුම බලාත්මක වන දිනය මාස 06 කින් ප්‍රමාද කර ඇත. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | ලැබී තිබුණු තොරතුරු අනුව, පැකේජ 04 යටතේ කිලෝවොට් 33 කුළුණු සහිත රැහැන් මාර්ග සහ කොටුමා උපපොලවල් ඉදිකිරීම සම්බන්ධයෙන් සියයට 42.18ක සහ සියයට 16.5ක අඩු භෞතික සහ මූල්‍ය ප්‍රගතියක් පෙන්වා තිබුණි. තවද, 2020 දෙසැම්බර් 31 දිනට කිලෝමීටර 56 දිගු කුළුණු සහිත රැහැන් යටතේ කුළුණු 211කින්, කුළුණු 113 අත්තිවාරම් කටයුතු පමණක් සම්පූර්ණ කර තිබුණු අතර කිසිදු එසවීමේ කටයුත්තක් නිම කර නොතිබුණි. | සැලසුම් කළ කාලසටහනට අනුව කුළුණු, පරිවාරක conductors යනාදී උපකරණ නැව 2021 වර්ෂය භාරදීමට නියමිත අතර 2020 වර්ෂය තුළදී මූලික කටයුතු සඳහා පමණක් ගෙවීම් කටයුතු සිදු කිරීම නිසා මූල්‍ය ප්‍රගතිය සියයට 16.5 සඳහා හේතු විය. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ඇ) | සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | | |
| (i) | පැකේජ 1 යටතේ පොල්පිටිය සිට හම්බන්තොට දක්වා කිලෝමීටර 144ක සම්ප්‍රේෂණ ජාල එළීමේ සහ කිලෝවොට් 132/32 හම්බන්තොට කොටුමා උපපොළ ඉදිකිරීම කටයුතුවල භෞතික ප්‍රගතිය සියයට 61 සහ මූල්‍ය ප්‍රගතිය සියයට 43ක් ලෙස ඉලක්කවලට පිටුපසින් පැවතුණි. ලැබී තිබුණු තොරතුරු අනුව, කුළුණු 452 කින්, කුළුණු 208ක අත්තිවාරම් කටයුතු පමණක් නිමකර තිබුණු අතර කුළුණු 71ක එසවීමේ කටයුතු සමාලෝචිත වර්ෂය තුළදී නිමකර තිබුණි. කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් කොන්ත්‍රාත් කාලය 2021 ජනවාරි 23 සිට 2021 සැප්තැම්බර් 20 දක්වා දීර්ඝ කර තිබුණි. | කිලෝවොට් 220 හම්බන්තොට කොටුමා උපපොළ සංවර්ධනය කිරීම 2018 දෙසැම්බර් 04 දින බලාත්මක වූ අතර 2020 දෙසැම්බර් 02 දින නිම කිරීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත්, ලොව පුරා පැවති කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් අපේක්ෂිත යන්ත්‍ර සහ අත්‍යවශ්‍ය අමතර කොටස් සහ පරීක්ෂණ හා ආරම්භ කරන ලද ඉංජිනේරුවන්ගේ විදේශවල සිට පැමිණීම ප්‍රමාද වූ අතර ව්‍යාපෘතියේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය යන දෙකම සඳහා බලපාන ලදි. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (ii) | කොන්ත්‍රාක් පැකේජ 02 යටතේ හබරන සිට වාලච්චේන දක්වා කිලෝමීටර 100 සම්ප්‍රේෂණ උප වැඩසටහන එ.ජ.ඩො මිලියන 3.21 ඇස්තමේන්තුගත වටිනාකම 2016 හතරවන කාර්තුවේ පිරිනැමීමට අවශ්‍ය වේ. කෙසේවෙතත්, ස්ථාවර අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් කෙටුම්පත් ලංසු ලියවිලි සඳහා අනුමැතීන් ලබා ගැනීමේ ප්‍රමාදයන් සිදුවීම වැනි විවිධ හේතූන් නිසා ප්‍රමාදයන් සිදුවී තිබේ. තවද, භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 9.5 සහ සියයට 12ක් වූ අතර ඉදිකිරීම් කටයුතු 2022 අප්‍රේල් 20 වන විට නිම කිරීම අවශ්‍ය වුවද 2020 අප්‍රේල් 30 දින කටයුතු ආරම්භ කර තිබුණි. | හොරණ පාදුක්ක සහ හබරන වාලච්චේන දෙකම AFD ණය මගින් මූල්‍යනය කරනු ලැබේ. AFD ණය ගිවිසුම 2019 මැයි බලාත්මක වේ. ඒ අනුව, කොන්ත්‍රාත් දෙකම 2019 ජූනි 2019 ජූනි පිරිනමා තිබුණි. කෙසේවෙතත්, කොන්ත්‍රාත් ගිවිසුමේ අවශ්‍යතා සපුරාලමින් හබරන වාලච්චේන කොන්ත්‍රාත්තුව 2019 නොවැම්බර් සිට බලාත්මක වේ. හොරණ පාදුක්ක කොන්ත්‍රාත්තුව 2020 අප්‍රේල් 30 දින සිට බලාත්මක වේ. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ සංරචකය යටතේ නඩුකුඩා සහ මන්නාරම කොටුම් උපපොළ ඉදිකිරීමේ කටයුතු 2020 මාර්තු නිම කළ යුතු වුවද කටයුතු නිම කර නොතිබුණු අතර 2020 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 88ක් සහ මූල්‍ය ප්‍රගතිය සියයට 82ක් දක්වා තිබුණි. | නඩුකුඩා කොටුමා උපපොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2018 මාර්තු 16 දින බලාත්මක වන අතර 2020 දෙසැම්බර් 15 දින නිමකිරීමට අපේක්ෂිත වේ. කෙසේවෙතත්, කොවිඩ් 19 වසංගතය සමග සංචරණ සීමා හේතුවෙන් OEM නිර්දේශිත ආරම්භ කිරීමේ විශේෂඥවරුන්ට විදේශයන් සිට පැමිණීමට නොහැකි වීම නිසා එය ආරම්භ කිරීමේ ප්‍රමාදයන් සිදු විය. | කටයුතු කඩිනම් කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම අවශ්‍ය වේ. |
| (iv) | පැකේජ 03 යටතේ කිලෝවොට් 132 (kv) මිලිමීටර් වර්ග 800 (sqmm) කොළඹ සී කොළොන්නාව සිට තනි ලැබීමක් සහ පිටවීමක සම්බන්ධතාවක් සහිත කොළඹ බී කොටුමා උපපොළ ඉදිකිරීම සහ කොළඹ සී සහ කොළොන්නාව කොටුමා උපපොළ වැඩිදියුණු කිරීමේ කටයුතු 2019 ඔක්තෝබර් 15 දින ආරම්භ කර තිබුණු අතර 2021 ඔක්තෝබර් 14 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, භෞතික සහ මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 44.5ක් සහ සියයට 16ක් විය. | කොළඹ බී කොටුමා උපපොළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව 2018 දෙසැම්බර් 10 දින පිරිනමා තිබුණි. කෙසේවෙතත්, ශ්‍රී ලංකා රජය සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර අතිරේක ණය ගිවිසුම 2019 මැයි 03 දින අත්සන් කර තිබුණි. එම නිසා කොන්ත්‍රාත් ගිවිසුම 2019 ජූලි 02 අත්සන් කරන ලද අතර කොන්ත්‍රාත්තුව බලාත්මක වන දිනය 2019 ඔක්තෝබර් 15 විය. | කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරන කටයුතු පිළිබඳ ඉහළ සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |
| (v) | කොටුගොඩ, කොලොන්නාව, හොරණ, පාදුක්ක, දෙහිවල සහ මාදම්පේ කොටුමා උපපොළවල් වැඩිදියුණු කිරීම ඔක්තෝබර් 22 ආරම්භ කර තිබුණු අතර භෞතික හා මූල්‍ය ප්‍රගතිය සියයට 65.5ක් හා සියයට 84ක් විය. | ව්‍යාපෘතිය 2018 ඔක්තෝබර් ආරම්භ කර තිබුණි අතර 2020 ඔක්තෝබර් නිමකිරීමට අපේක්ෂිත වේ. කෙසේවෙතත්, සිවිල් කටයුතුවල සැලකිය යුතු ප්‍රමාදයන්ට 2020 මාර්තුවේදී ආරම්භ වූ කෝවිඩ් 19 වංසගත තත්ත්වය හේතුවිය. | කොන්ත්‍රාත්කරුවන් විසින් සිදු කරන කටයුතු පිළිබඳ ඉහළ සහ කාර්යක්ෂම කොන්ත්‍රාත් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. |

**3.2 ඌන උපයෝජිත සම්පත්**

| විගණනගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මුළු ප්‍රතිපාදනය රු.මිලියන 37.89කට සමාන එජඩො මිලියන 260කින් 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 13.38කට සමාන එජඩො මිලියන 92ක් පමණක් උපයෝජනය කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, වැඩසටහනේ පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්කවලට අනුව, සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.මිලියන 37.9කට සමාන | ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ADB එස්ආර්අයි 3484/3483 ණය ගිවිසුම් 2017 ජනවාරි බලපැවැත්වීමට අපේක්ෂිත වූ අතර කෙසේ වෙතත්, 2017 ජූලි සිට බලපැවැත්වුණි. AFD 8313 ණය ගිවිසුම 2019 මැයි බලපැවැත් | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි සඳහන් මූල්‍ය ඉලක්ක සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| | එජඩො මිලියන 259.9ක් උපයෝජනය කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත්, එදිනට එම ඉලක්කයෙන් සියයට 35ක් පමණක් අත්කරගෙන තිබුණි. වෙන්කරන ලද අරමුදල්වල මන්දගාමී උපයෝජනයේ ප්‍රතිඵලයක් ලෙස ණය නියෝජිත ආයතනය විසින් රු.මිලියන 79.45ක බැඳීම් ගාස්තු අයකරගෙන තිබුණි. | විය. මූල් පාරිසරික නිශ්කාෂණය සහ ඉඩම් සමීක්ෂණය සඳහාත් යම් කාලයක් ගත වී ඇත. | |

**3.3** පරිබාහිර කටයුතු

| | විගණන ගැටලු | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මෝටර් වාහන 35 අයිතිය කොන්ත්‍රාත්කරුගේ නමට පැවතීම හේතුවෙන් ණය මුදල්වලින් ව්‍යාපෘතිය 2016 සිට 2020 දක්වා කාලය තුළ රු. මිලියන 218.97 පිරිවැයකට මිලදී ගත් මෝටර් වාහන 35ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට ගිණුම්ගත කර නොතිබුණි. තවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් අදාළ වාහනවල අයිතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වෙත මාරු කිරීමට කිසිදු පියවර ගෙන නොතිබුණු අතර ඒ සඳහා දත්ත සමුදායක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සඳහන් කරන ලද කාලය තුළ කොන්ත්‍රාත්කරු විසින් මෝටර් වාහන 35 ක් සපයා තිබුණු අතරෙ කොන්ත්‍රාත් ගිවිසුම අනුව, එම වාහන සඳහා ගෙවීම් කර තිබුණි. කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද සියලුම ගෙවීම් කෙරී ගෙන යන වැඩ යටතේ වාර්තා කර ඇත. වත්කම පසුව හඳුනා ගනු ලැබේ. | ලංකා විදුලි බල මණ්ඩලයට සිදු විය හැකි අවධානම අවම කිරීම සඳහා කොන්ත්‍රාත් ලියවිලිවලට වගන්ති ඇතුළත් කළ යුතුය. |
| (ආ) | ප්‍රධාන සංරචක 03 යටතේ වැඩසටහනේ කටයුතු අධීක්ෂණය හා නියාමනය ලංකා විදුලිබල මණ්ඩලයේ වෙනම අංශ ප්‍රධානීන් තිදෙනෙකු යටතේ පැවතුණි. | සියලුම ව්‍යාපෘති සංරචක සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල විසින් මාසික ප්‍රගති සමාලෝචන සිදු කරනු ලැබේ. තවද, ව්‍යාපෘති ප්‍රගති සමාලෝචන බලශක්ති අමාත්‍යාංශය, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ භාණ්ඩාගාරයේ ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරනු ලැබේ. | වැඩසටහන් කටයුතු ව්‍යාපෘති කළමනාකරුවකු යටතේ අධීක්ෂණය විය යුතුය. |